ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

## AA1 විභාගය - ජනවාරි 2020

## (AA12) ව්‍යාපාර සඳහා ප්‍රමාණාත්මක ක්‍රම

---

### A - කොටස

### ප්‍රශ්න අංක 01

සමස්ත විෂය නිර්දේශයම ආවරණය වන පරිදි මෙම වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQ), ලකුණු 3 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 10 කින්ද, ලකුණු 02 බැගින් වූ කෙටි ප්‍රශ්න 05 කින්ද සමන්විත වූ අතර මුළු ලකුණු 40 කි. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට මුළු ලකුණු වලින් අඩකට වඩා ලකුණු ලබාගෙන තිබුණි. සමස්තයක් ලෙස අයදුම්කරුවන් හොඳින් කියවා අවබෝධයෙන් යුතුව සාර්ථකව මෙම කොටසට උත්තර ලියා තිබුණි. ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා තිබූ බහුවරණ ප්‍රශ්න 10 ට, නිවැරදි වරණ තෝරා අදාල ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දැක්වීම අපේක්ෂා කලත් සමහර අයදුම්කරුවන් ප්‍රශ්නවලට සම්පූර්ණ විස්තරාත්මක උත්තර ලියා තිබුණි. සමහර අයදුම්කරුවන් එකම ප්‍රශ්නයට වරණ කිහිපයක් ලියා තිබුණි. වරණ අංකය අපැහැදිලිව ලියා තිබූ අවස්ථා ද දක්නට ලැබුණි.

01 වන ප්‍රශ්නයේ අනු කොටස්වලට දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා සහ ඒ පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ:

**1.1.** සරල සමීකරණයක විසඳුම සෙවීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කළ අතර බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර සපයා තිබුණි.

**1.2.** මෙය සුළු පොලිය ගණනය කිරීම පිළිබඳව අවබෝධය මැනීම සඳහා වූ ප්‍රශ්නයකි.

$\mathrm{I} = \frac{ptr}{100}$ සූත්‍රයට ආදේශ කිරීම මෙහිදී අපේක්ෂා කර ඇති අතර බහුතරයක් සිසුන් සාර්ථක පිළිතුරු සපයා තිබුණි.

**1.3.** මෙම ගැටළුවෙන් සමාගමක මුළු ආදායම් (TR) ශ්‍රිතය ලබාදී එම ආදායමට අදාලව ආන්තික ආදායම් (MR) ශ්‍රිතය සොයා ගැනීම පිළිබඳව විමසා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර සළකුණුකර තිබුණි. මෙහිදී සමහර සිසුන්ට මුළු ආදායම් ශ්‍රිතය අවකලනය කිරීමෙන් ආන්තික ආදායම් ශ්‍රිතය ලබාගත හැකිබව පිළිබඳව නිවැරදි අවබෝධයක් නොතිබූ අතර අතලොස්සක් පමණ අයදුම්කරුවන්ගේ අවකලනය කිරීම පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව දක්නට ලැබුණි.

**1.4.** මෙම ප්‍රශ්නය මගින් ප්‍රමාණ සාපේක්ෂකය (Quantity relative) ගණනය කිරීමට $\frac{q1}{q0} \times 100$ නිවැරදිව ආදේශකර සුළු කිරීම අපේක්ෂා කළත් සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි පිළිතුර ලබාගෙන නොතිබුණි.

**1.5.** දී ඇති ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV) සෙවීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂාකර ඇති අතර බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර ඉදිරිපත් කර නොතිබුණි. නිවැරදි සූත්‍රය යොදා නිවැරදිව ගණනය කිරීමට අයදුම්කරුවන්ට ඇති දැනුම අල්ප බව දක්නට ලැබිණි.

මෙම NPV අගය ලෙස ගණනය කළ විට ලැබෙන අගයට වඩාත් ආසන්න අගය (රු.1,215,000/-) මෙහිදී අපේක්ෂා කළ අතර එසේ ගණනය කර ආසන්න අගය ලබා ගැනීමට අයදුම්කරුවන් බහුතරයක් අපොහොසත් වී තිබුණි.

**1.6.** මෙම ප්‍රශ්නයෙන් අයිතම 3 කට අදාලව මිල දර්ශක හා ඒවායේ බර තැබීමද ලබා දී එම අයිතම 3 සඳහා හරිත සාමාන්‍ය සාපේක්ෂ මිල දර්ශකය ගණනය කරන ලෙස දක්වා තිබුණි.

මිල දර්ශකය= $\frac{\sum p1}{\sum po} \times 100$ යන සූත්‍රය භාවිතයෙන් සාමාන්‍ය සාපේක්ෂ මිල දර්ශකය ලබාගත යුතුය. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදි පිළිතුර තෝරා තිබුණි. මෙම දර්ශකය ගණනය කිරීම පිළිබඳව නිවැදි අවබෝධයක් බොහෝ සිසුන්ට තිබුණ බව පෙනුණි.

**1.7.** මෙහිදි වර්ෂ 6 ක් තුල රටක බලශක්ති පරිභෝජනයට අදාල උපනති සමීකරණය ලබාදී 2019 වර්ෂය සඳහා බලශක්ති පරිභෝජනය ඇස්තමේන්තුගත කරන ලෙස විමසා තිබු අතර ඒ සඳහා අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් පමණක් නිවැරදි පිළිතුර තෝරා තිබුණි.

උපනති සමීකරණය $T = 210 + 3x$ සඳහා $x = 7$ ආදේශයෙන් 231 අගය ලබාගැනීමට අයදුම්කරුවන් බහුතරයක් අසමත් වී තිබුණි.

**1.8.** දී ඇති වෙන් රූපය (Venn diagram) ඇසුරින් මේලයේ සම්භාවිතාව P(MUY) සෙවීම මෙම ප්‍රශ්නය මඟින් අපේක්ෂා කර ඇත. වෙන් රූපයේ අදාල ප්‍රදේශ තුනේ සම්භාවිතා එකතුවෙන් P(MUY) ලැබෙන බවට අවබෝධය අඩුකම නිසා සමහර අයදුම්කරුවන් නිවැරදි පිළිතුර ලබාගෙන නොතිබුණි. සමහර අයදුම්කරුවන් $M \cap Y = 0.12$ සැලකිල්ලට ගෙන නොතිබුණි.

**1.9.** සමාගමක විකුණුම්වල අපේක්ෂිත අගය සම්භාවිතා ව්‍යාප්තිය මඟින්,

$E(x) = \sum_{i=1}^{n} xp(x)$ සූත්‍රයට ආදේශ කිරීමෙන් පිළිතුර ලබා ගැනීමට අපේක්ෂා කළ අතර මූලික සිද්ධාන්ත පිළිබඳ දැනුම මඳකම නිසා අතලොස්සක් අයදුම්කරුවන් වැරදි පිළිතුරු සපයා තිබුණි. බහුතරයක් සිසුන් මේ සඳහා නිවැරදි පිළිතුර සපයා තිබුණි.

**1.10.** මෙම ප්‍රශ්නය වැල් පොලිය ගණනය කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා ඇතුළත් කර තිබූ ප්‍රශ්නයකි. $S = X(1 + r)^n$ සූත්‍රය ආදේශ කිරීම ප්‍රශ්නය මඟින් අපේක්ෂාකර ඇත. නමුත් මෙහිදී $(1 + r)^n$ බලය ගණනය කිරීම නිවැරදිව කිරීමට අතලොස්සක් අයදුම්කරුවන්ට නොහැකි විය. ගණක යන්ත්‍ර භාවිතාකර නිවැරදි පිළිතුර සපයා තිබූ අයදුම්කරුවන් බහුතරයක් විය.

**1.11.** මෙය ලාභ අලාභ ගණනය පිළිබඳ දැනුම පරීක්ෂා කළ ප්‍රශ්නයකි. මෙමගින් විකුණුම් මිල සහ ලාභාන්තිකය ලබා දී ගැනුම් මිල ගණනය කිරීම අපේක්ෂාකර ඇත. ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් මේ සඳහා නිවැරදි පිළිතුර සපයා තිබුණි.

**1.12.** සුළු පොලිය ගණනය පිළිබඳ වූ ප්‍රශ්නයකි. සුළු පොලිය සඳහා වූ ප්‍රකාශනය ඇසුරෙන් සමීකරණය ගොඩ නගා එය විසඳීමෙන් අදාල ආයෝජනය කළ මුදල සෙවිය යුතුය. මෙහිදී බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධකර නොතිබුණි. 8% බැගින් ආයෝජනය කළ මුදල x ලෙස ගෙන $x \times \frac{8}{100} + (500,000 - x)\frac{6}{100} = 38,000$ ලෙස සමීකරණ ගොඩනැගීමට අයදුම්කරුවන් බහුතරයක් අපොහොත් වී තිබුණි.

**1.13.** මෙමගින් නියැදීම (Sampling) පිළිබඳ න්‍යායාත්මක දැනුම පරීක්ෂාකර තිබුණි. මෙහිදී නියැදීම භාවිතා කිරීමට හේතු අසා ඇති අතර බහුතරයක් අයදුම්කරුවන් මෙයට සාර්ථකව පිළිතුරු ලියා නොතිබුණි. කිසිඳු සම්බන්ධයක් නොමැති පිළිතුරු බහුතරයක් විසින් ලියා තිබුණි.

**1.14.** 1.14 සහ 1.15 ප්‍රශ්න වලදී දී ඇති ප්‍රකාශ සත්‍ය අසත්‍යතාව විමසා ඇති අතර එහිදී 1.14 විචල්‍ය දෙකක් අතර ඇති සහසම්බන්ධක සංගුණකය-1 වීම පිළිබඳ දැනුම පරීක්ෂාකර තිබුණි. එය ප්‍රබල ඍණ සම්බන්ධයක් යන වග බහුතරයක් අයදුම්කරුවන් හඳුනාගෙන නොතිබුණි.

**1.15.** සමච්ඡේදක ලක්ෂයේදී මුළු ආදායම මුළු පිරිවැයට සමාන වීම පිළිබඳ න්‍යායාත්මක දැනුම පරීක්ෂාකර තිබුණි. අයදුම්කරුවන් සියල්ලක්ම පාහේ මේ සඳහා නිවැරදි පිළිතුර සපයා තිබුණි.

## <u>B - කොටස</u>

**උත්තර පත්‍ර ඇගයීමේදී අනිවාර්ය ප්‍රශ්න 4 කින් සමන්විත මෙම කොටසේ අයදුම්කරුවන්ගේ උත්තර වල පහත දෑ නිරීක්ෂණය විය.**

## ප්‍රශ්න අංක **02**

මූල්‍යමය ගණිතය කොටසේ එන වැල් පොලිය වර්ෂ 02 අවසානයේ ගිණුමේ තිබෙන මුළු මුදල උපයා තිබෙන මුළු පොලිය හා වාර්ෂික වාරිකයක වටිනාකම සෙවීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා දෙන ලද ගැටළුවකි. සමස්ථයක් ලෙස (a) (i) **කොටස** බහුතරයක් අයදුම්කරුවන් සාර්ථකව උත්තර ලියා තිබුණු අතර (a) (ii) **කොටසට** සැලකිය යුතු පිරිසක් සාර්ථකව උත්තර ලියා තිබුණි. නමුත් (b) **කොටසට** උත්තර ලිවීම ඉතාමත් අවම වූ අතර ,එයිනුත් සාර්ථක පිළිතුර ලියා තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසක් පමණි.

වැල් පොලී සූත්‍රය භාවිතකර $S = X(1 + r)^2$ වසරින් වසර වැල් පොලිය සොයමින් වසර 2 ක් අවසානයේ ගිණුමේ ඇති මුළු මුදල සෙවීමට සමහර අයදුම්කරුවන් උත්සාහ ගෙන තිබූ අතර, වැඩි වශයෙන් දීර්ඝ ක්‍රම භාවිත කිරීම නිසාම ඔවුන්ට සුළු කිරීමේ දෝෂ සඳහා වැඩි වශයෙන් මුහුණ දීමට සිදුවී තිබුණි.

වාරිකය සෙවීමට $A = \frac{S \times R^n \times (R-1)}{R^n - 1}$ සූත්‍රය හෝ DCF සූත්‍ර භාවිත නොකර වැරදි ක්‍රම භාවිතා කර තිබුණි.

## ප්‍රශ්න අංක **03**

මෙම ප්‍රශ්නය (a) සහ (b) යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වේ. මුළු ආදායම් ශ්‍රිතය (TR) හා මුළු පිරිවැය ශ්‍රිතය (TC) දී ඇති විට ලාභය උපරිම කරන ඒකක ගණන සෙවීම (a) **කොටස** මගින් ද යම් නිෂ්පාදිතයක පිරිවැය නිෂ්පාදන අයිතමයක විචල්‍ය පිරිවැය සහ මුළු ආදායම් ශ්‍රිතය (TR) ලබාදී, මුළු පිරිවැය ශ්‍රිතය හඳුනා ගැනීමද,සමච්ඡේදක ප්‍රමාණය ගණනය කිරීමද (b) **කොටසින්** බලාපොරොත්තු විය.

**(a)** සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් ලාභ ශ්‍රිතය (P), මුළු ආදායම් ශ්‍රිතයෙන් (TR) මුළු පිරිවැය ශ්‍රිතය (TC) අඩු කිරීම මඟින් ලැබෙන බව නිවැරදිව අවබෝධ කරගෙන නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් TR-TC සුළු කිරීමේදී වරදවා ගෙන තිබුණි. සැලකිය යුතු සිසුන් ප්‍රමාණයකට අවකලය කිරීම පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබුණු බව පැහැදිලි විය. සුළු අයදුම්කරුවන් පිරිසක් TP= TC -TR ලෙස සලකා ගැටළුව විසඳීමට උත්සාහකර තිබුණි.

ලාභ ශ්‍රිතය නිවැරදිව දක්වා තිබූ අයදුම්කරුවන්ගෙන් බහුතරයක් එය අවකලනය කර 0 වට සමාන කිරීමෙන් ලාභය උපරිම කරන ඒකක ප්‍රමාණය නිවරදිව ගණනය කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් ලාභ ශ්‍රිතය (P) = 0 ලෙස ගෙන වැරදි පිළිතුරු සපයා තිබුණි. සමහර සිසුන් විකල්ප ක්‍රමයක් වන ආන්තික ආදායම (MR, ආන්තික පිරිවැයට (MC) සමාන කිරීම මගින් ලාභය උපරිම කරන ඒකක ප්‍රමාණය නිවැරදිව ගණනය කළහ. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් MR = MC වෙනුවට TR = TC ලෙස සලකා ගැටළුව විසඳීමට උත්සාහ කිරීමෙන් නිවැරදි පිළිතුර ලබාගෙන නොතිබුණි.

**(b)** **(i)** මුළු පිරිවැය ශ්‍රිතය සොයා එමගින් ලාභශ්‍රිතය සෙවීම අපේක්ෂාකර තිබූ අතර සමහරක් සිසුන් TR-TC වෙනුවට TC-TR ගණනය කර තිබුණි.මෙහිදී අයදුම්කරුවන් බහුතරයක් වරහන් සුළු කිරීමේදී,

$TR - TC = 74x + 2x^2 - (3x^2 - 86x + 250)$ සෑම පදයක්ම සෘණ (-) වලින් ගුණ කිරීම සිදුකර නොතිබුණි.

**(ii)** සමච්ඡේදක ප්‍රමාණය ගණනය කිරීම සඳහා TR-TC ගණනය කර අදාල x සෙවිය යුතු විය. නැතහොත් ලාභ ශ්‍රිතය 0 වට සමාන කර අදාල x සෙවිය යුතු විය යුතුය. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් මේ සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත.

## ප්‍රශ්න අංක **04**

මෙම ප්‍රශ්නය **(a), (b)** සහ **(c)** යනුවෙන් කොටස් තුනකින් යුක්ත විය. දී ඇති දත්ත උපයෝගීකරගෙන මධ්‍යනය **(a)** මගින්ද සම්මත අපගමනය සෙවීම **(b)** මඟින් ද බලාපොරොත්තු වූ අතර **(c)** විචලතා සංගුණකය සෙවීමේ දැනුම පරීක්ෂාකර තිබුණි.

දී ඇති දත්ත උපයෝගී කරගෙන සේවකයන් 50 දෙනෙකුගේ මාසික වැටුපේ මධ්‍යනය, සම්මත අපගමනය හා විචලතා සංගුණකය ගණනය කළ යුතු විය.

**(a)** අයදුම්කරුවන්ගෙන් බොහෝ පිරිසක් නිවැරදිව $\bar{x} = \frac{\sum_{i=1}^{n} fixi}{\sum_{i=1}^{n} fi}$ සූත්‍රය භාවිතා කර මධ්‍යන්‍යය ගණනය කර තිබුණි. සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් ,පන්තිප්‍රාන්තර වල මධ්‍ය අගය නිවැරදි ලෙස ගණනය නොකිරීමත්, දත්තවල f හා x අගයන් මාරු කර වටහා ගැනීමත්, $\sum fx$ එකතුව නිවැරදිව නොගැනීම නිසාත් නිවැරදිව මධ්‍යන්‍යය ගණනය කිරීමට නොහැකි විය.

**(b)** සැලකිය යුතු සිසුන් ප්‍රමාණයක් සේවක වැටුපේ සම්මත අපගමනය ගණනය කර තිබුණි. මෙහිදී ඇතැම් සිසුන් නිවැරදි සූත්‍රය වූ $\sqrt{\frac{\sum fxi^2 - x^2}{\sum f}}$ භාවිත නොකිරීමත් සූත්‍රය සම්පූර්ණයෙන් ලියා නොගැනීමත්,

$(\sum x)^2$ හා $\sum x^2$ අතර වෙනස නිවැරදිව හඳුනා නොගැනීමත් අවශ්‍ය පද ගණනය නොකිරීමත් $fx^2$ සෙවීමේදී $fx \times fx$ ලෙස නොගෙන $fx \times f$ ලෙස ගෙන නිවැරදි ලෙස ආදේශ නොකිරීම හේතුවෙන් නිවැරදි පිළිතුර ලබා ගැනිමට නොහැකි විය.

**(c)** විචලතා සංගුණකය සෙවීමේදී $\frac{\text{සම්මත අපගමනය}}{\text{මධ්‍යනයය}} \times 100$ යන සූත්‍රය නිවැරදිව යොදා නොගැනීම හා ඉහත a හා b හි නිවැරදි පිළිතුරු ලබා ගැනීමට නොහැකිවීමෙන් නිවැරදි පිළිතුර ලබා ගැනීමට බහුතරයක් අයදුම්කරුවන්ට නොහැකි විය.

## ප්‍රශ්න අංක **05**

මෙය ප්‍රතිපායනය හා සම්බන්ධ ගැටළුවකි. වාහන නිෂ්පාදන සමාගමක් මාස 06 තුළ විකුණන ලද වාහන x හා එහි නිෂ්පාදන පිරිවැය y වලට අදාල දත්ත සමඟ එහි නිෂ්පාදන පිරිවැය වගුවක් මඟින් දී ඇත.

**(a)** ප්‍රස්ථාර කොලයක් භාවිතයෙන් දී ඇති දත්ත විසිරි තිත් සටහනක දක්වා අයදුම්කරුවන් බහුතරයක් ලකුණු ලබාගෙන තිබුණි. ඛණ්ඩාංක මාරු කර ප්‍රස්ථාරය වැරදි ආකාරයට ලකුණු කළ අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් විය.

**(b)** $y = a + bx$ මඟින් දෙනු ලබන අඩුතම වර්ග ප්‍රතිපායන රේඛාව පිළිබඳව ප්‍රශ්නය අසා තිබුණි.

මීට අදාල a හා b නියත ගණනය කිරීමේදී $b = \frac{n\sum xy - \sum x \sum y}{n\sum x^n - \sum x^n}$ සහ $a = \bar{y} - b\bar{x}$ නිවැරදිව ආදේශ කර නොතිබුණි.

**(c)** ප්‍රතිපායන රේඛාව නිවැරදිව සොයන ලද සිසුන්ගෙන් බහුතරයක් මෙම කොටස සඳහා ද නිවැරදි පිළිතුරු සැපයූහ. අනෙක් සිසුන් සුළු කිරීම් දෝෂ හේතුවෙන්ද ප්‍රශ්නය ගැන නිවැරදි අවබෝධයක් නොමැති බැවින්ද නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වූහ. එසේම තවත් සමහරක් අයදුම්කරුවන් සමීකරණයට x=55 ආදේශ කර අපේක්ෂිත නිෂ්පාදිත පිරිවැය ගණනය කිරීම වෙනුවට අනවශ්‍ය ගණනය කිරීම් කර තිබුණි.

## C - කොටස

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය **A, B** හා **C** යන කොටස් තුනකින් යුක්ත විය. **A කොටසින්** සමගාමී සමීකරණයක් විසඳීමද **B කොටසින්** කාල ශ්‍රේණි පිළිබඳවද **C කොටසින්** සම්භාවිතාවට අදාල ප්‍රශ්නයකුත් ඉදිරිපත් කර තිබුණි.

**(A)** මෙම කොටස සමගාමී සමීකරණ දෙකක් විසඳා x හා y වලට අදාල අගයන් සෙවීම අපේක්ෂා කර තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා සුළු අයදුම්කරුවන් පිරිසක් සමගාමී සමීකරණ විසඳීමේදී නිවැරදිව ගණනය කිරීම් කර නොතිබුණි.

**(B)** මෙය නිෂ්පාදිතයක විකිණුම්වලට අදාලව ඉදිරිපත්කරන ලද කාලශ්‍රේණි පිළිබඳ ප්‍රශ්නයකි. කාර්තුමය විකුණුම්, කාර්තු 4 හි චල මධ්‍යක සහ මධ්‍යගතවල මධ්‍යක කොටසක් පමණක් සඳහන් කර ඇති වගුවක හිස්තැන් පිරවිය යුතු විය. බොහෝ සිසුන් ප්‍රමාණයක් (a) සිට (c) හිස්තැන් සඳහා කාර්තු 4 හි චල මධ්‍යක හා (d) හා (e) සඳහා මධ්‍යගත වල මධ්‍යක නිවැරදිව ගණනය කරන ලදී. නමුත් Y/T හි අගය සෙවීමේදී අඩුපාඩු සිදුවී තිබුණි.

**(C)** මෙම කොටස සම්භාවිතාව පිළිබඳ ගැටළුවකි. දී ඇති ගැටළුව හොඳින් කියවා රුක් සටහනක් ඇඳීම **(a) කොටස** මගින් අපේක්ෂා කළ අතර ම රුක්සටහන ඇඳීමේදී මූලික වශයෙන් අවස්ථා වෙන්කර දැක්වීමට (අතු) නම් කිරීම බහුතරයක් අයදුම්කරුවන් අසමත්ව තිබුණි. ඇතැම් අයදුම්කරුවන් රුක් සටහන වෙනුවට බෝල සහිත චිත්‍ර සටහන් ද ඇඳ තිබුණි. **(b) කොටස** මගින් රුක් සටහන ඇසුරෙන් සම්භාවිතාව සෙවීමේදී ගණනය කිරීමේ මූලධර්මයට අනුව එක් එක් අත්තේ සම්භාවිතා එකිනෙක ගුණ කළ යුතු වුවද ඒවා එකතු කිරීම ඇතැම් අයදුම්කරුවන් සිදුකර තිබුණි. සම්භාවිතාවල එකතුව 1 වන බව හා ප්‍රතිශත දශම බවට පෙරළීමේ හැකියාවද අවම බව දක්නට ලැබුණි. අඩුම තරමින් (Atleast) යන වචනය නිවැරදිව අවබෝධකර නොගැනීම ද දක්නට ලැබුණු අතර එහිදී අඩුම තරමින් අවස්ථාවට අදාල **(b) (ii)** සහ **(iii)** සියළුම ආකාර හඳුනා ගැනීමටද සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් අපොහොසත් වී තිබුණි.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණුඃ**

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

(2) අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

(3) සූත්‍ර පිටපත් කිරීමේදී සහ සූත්‍රවලට ආදේශ කිරීමේදී මූලික ගණිත නීති හා සුළු කිරීම නිවැරදිව කළ යුතුය. සමහර ප්‍රශ්න සඳහා උත්තර සැපයීමේදී සූත්‍ර කීපයක්ම යොදාගත හැකි අතර ඉන් වඩාත්ම පහසු සූත්‍රය යොදා ගැනීම,තවද සූත්‍ර පත්‍රිකාවෙන් සූත්‍ර පත්‍රිකාවෙන් සූත්‍ර පිටපත් කිරීමේදී " +" " -" ලකුණු මාරු නොකර සටහන් කර ගැනීමට වගබලා ගත යුතුය.

(4) සමහර සූත්‍ර මගින් විසඳිය යුතු ප්‍රශ්නවලදී අයදුම්කරුවන් සූත්‍රය ලියා අගයන් ආදේශ කිරීම නොපෙන්වා ගණකයන්ත්‍රය මඟින් අවසන් උත්තරය පමණක් ලබාගෙන සටහන් කර තිබුණි. නමුත් අයදුම්කරුවන් සූත්‍රය ලියා එයට නිවැරදි අගයන් ආදේශකර උත්තරය ඉදිරිපත්කිරීමට කටයුතු කිරීම යෝග්‍ය වේ. මෙහිදී අවසාන උත්තරය නිවැරදි නොවන අවස්ථාවලදී වුවද අදාල පියවරයන් වලට ලකුණු ලබා ගැනීමට හැකියාව පවතී.

(5) සමීකරණ විසඳීම,ශ්‍රිත අවකලනය ආදිය ගණිත මූලධර්ම නිවැරදිව යෙදීමට අභ්‍යාස කළ යුතුය.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) කාලය මනාව කළමණාකරණය කර ගැනීම.

(10) උත්තර පත්‍ර භාර දීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේ දැයි නැවත පරීක්ෂාකර බැලීම.

(11) එක් ප්‍රශ්නයක උත්තරය අවසානයේ ඊළඟ ප්‍රශ්නය අලුත් පිටුවකින් ආරම්භ නොකර,පෙර පිටුවේ ඉතා කුඩා ඉඩක අලුත් ප්‍රශ්නය ආරම්භ කළ අවස්ථා බොහෝ තිබුණි. සැම විටම අලුත් ප්‍රශ්නයක් අලුත් පිටුවකින් ආරම්භ කිරීමට අයදුම්කරුවන් වගබලා ගත යුතුය.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -